
# සඳු

සදුෂි අමංගා ඉදුරුව



# සඳු

සදුෂි අමංගා ඉඳුරුව

ප්‍රථම මුද්‍රණය : 2025.02.08

කර්තෘ : සදුෂි අමංගා ඉඳුරුව

ලිපිනය : 309/63A,
ජෝර්ජ් ඊ ද සිල්වා මාවත,
මහනුවර.

ISBN අංකය : 978-624-208-381-0

මුද්‍රණය
“PRESS”
නො.24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

දැනුමෙන් පෝෂණය කරන්නට
වෙර දරන,
මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,
පංතිභාර ගුරුතුමිය,
ඇතුළු ගුරු මව්පියන්ටත්,
මා පෝෂණය කරන,
ඇතිදැඩි කරන
මාගේ මව්නි, පියාණෙනි ඔබ
දෙපලටත්,
මා වැනිම දැනුම හඹා යන
මාගේ සොයුරු කැළටත්
මේ පොත ආදරයෙන් පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''**හෙරණගත්කරණී**'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

සඳු කියන්නේ එකමත් එක කාලෙක ලස්සන ගමක හිටිය ලස්සන ගෑනු ළමයෙක්. අම්මා, අප්පච්චි, අයියලා එක්ක හුරතලයට හැදුන හරිම අහිංසක හොඳ ළමයෙක්. එයාලා ගොඩක් පොහොසත් අය නෙමේ. ඒත් අම්මා සඳුවත් අයියලාවත් හොඳ ගුණධර්ම කියලා දීලා හොඳට හැදුවා. අප්පච්චි රස්සාවට යන නිසා සඳු නිතරම හිටියේ අම්මා එක්ක. සඳු හොඳට ඉගෙන ගත්ත කීකරු ළමයෙක්.



එක දවසක් සඳුගේ අප්පච්චි ගෙදර හිටියා. අප්පච්චි සඳුට සල්ලි දීලා ලග තියෙන කඩෙන් පලතුරු වගයක් ගේන්න කිව්වා. සඳු සල්ලිත් අරන් කඩේට යන්න පිටත් වුනා.




කඩේට යන අතරමඟ සඳු දැක්කා පර්ස් එකක් බිම වැටිලා තියෙනවා. එයා ඒක අහුලා ගත්තා. ඒක ඇතුලෙ ගොඩක් සල්ලි තිබුනා.

සඳු හොඳ ළමයෙක්. එයාට ඕන උනා ඒක අයිතිකාරයට දෙන්න. එයා ඒක ඇතුලේ තිබුන කිසි දෙයක් ගත්තේ නෑ. පර්ස් එක ඇතුලෙ අයිති කෙනාගේ ලිපිනය තිබුන කාඩ් එකක් ලැබුණා.



සඳු පර්ස් එකත් අරන් අයිති කෙනාගේ ගෙදරට ගියා. ඒ වෙනකොටත් අයිති කෙනා හොඳටම බය වෙලයි හිටියේ. සඳු ඒ කෙනාට පර්ස් එක දුන්නා. ඒ මනුස්සයට හරිම සතුටුයි. ඒකෙ කිසි දෙයක් අඩු වෙලා නෑ. ඒ කෙනා සඳුට ඕන දෙයක් ඉල්ලන්න කිව්වා. ඒත් සඳුට ඕන උනේ ඒක අයිති කෙනාට දෙන්න විතරයි. ඒ මනුස්සයා දුන්න මුදල්-තෑගි කිසි දෙයක් සඳු බාර ගත්තෙ නෑ.



සඳු ගෙදර ඇවිත් වුන හැමදේම අම්මටයි, අප්පච්චිටයි කිව්වා. එයාලට හරිම සතුටුයි. ගමේම මේ සිදුවීම පැතිරුනා. සඳු හොඳ ළමයෙක් කියන එක ගමේ හැමෝම කතා උනා. ගොඩක් අය ගෙදරටම ඇවිත් සඳුට වර්ණනා කරා.


අම්මයි, අප්පච්චියි හොඳ ළමයෙක් වෙන එකේ හොඳ සඳුට පැහැදිලි කරා. තව තවත් හොඳ දේවල් කරන්න උනන්දු කරා. කවුරු මොනවා කිව්වත් ඔයා කරන හොඳ දේවල් නතර නොකරන්නත් කියලා දුන්නා.



මේ සිද්ධියෙන් ටික දවසකට පස්සේ සඳුගේ උපන්දිනේ ආවා. අම්මයි, අප්පච්චියි සඳු ඉස්කෝලෙ ගිය වෙලාවේ තෑගි ගෙනල්ලා, කෑම ගොඩක් ජාති හදලා සඳුව පුදුම කරවන්න ලෑස්ති කලා.

මෙන්න.... සඳු ගෙදර එනකොට අප්පච්චි ගෙදර ලස්සනට සරසලා. බැලූම් එල්ලලා. අම්මා සඳු ආස රස රස කෑම ගොඩාක් හදලා. අප්පච්චි තෑගිත් ගොඩක් ගෙනත්. හවස පොඩි සාදයකුත් තිබුණා.

ගමේ සඳුලගේ නෑයො කීප දෙනෙකුත් ආවා. හැමෝම පුදුස කරමින් අර පර්ස් එකේ අයිතිකාර මනුස්සයත් ඇවිත්. එයා තෑගි ගොඩක් සඳුට අරන් ඇවිත්. සඳුට හරිම සතුටු දවසක්.



සඳුගේ පවුලේ අය, නෑයෝ හැමෝම ඉන්න තැන අර මනුස්සයා සඳු එදා කරපු හොඳ වැඩේ අගේ කලා. එයාව හරියට වර්ණනා කලා.

ඒ වගේ ගුණයහපත් දරුවෙක් හදපු දෙමව්පියන්ට ස්තුති කලා.

අවංකභාවයේ හා පරිත්‍යාගශීලීභාවයේ හොඳ නරක සඳු හොඳින් වටහා ගත්තා. සඳු තව තවත් හොඳ දේවල් කරන්න හිතා ගත්තා.

නිමි



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණාකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්